**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - 2023**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2හි 29 වගන්තිය ප්‍රකාරව ඍජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී අතිරික්තය සමඟ ශුද්ධ මුදල් ප්‍රවාහය සසඳා හෙළිදරව් කලයුතු වුවත් අධිකාරිය විසින් එසේ සිදුකර නොතිබුණි. | එකඟ වේ. අප ඉදිරිපත් කළ යුතු අකෘතිය නිවැරදි විය යුතුය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 31 වගන්තිය අනුව ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් ජනනය වන මුදල් ප්‍රවාහයන් එම ක්‍රියාකාරකම් යටතේ වෙන් වෙන්ව නිරූපණය කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අභිජනනාගාර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් වැය කරන ලද රු.155,121,285 ක මුදලක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | එකඟ වේ. 2024 වර්ෂයේ ගිණුම් තුලින් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වැලිකන්ද අභිජනනාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාළව රු.14,363,746 ක කාර්යසාධන බැදුම්කරය මුදල් කර ගැනීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු යොමු වූ බේරුම්කරණ සභා තීන්දුව අනුව නැවත කොන්ත්‍රාත් ආයතනය වෙත ප්‍රමාද පොළී ගාස්තු රු.12,209,896 ක් ඇතුලත්ව රු.34,049,373 මුදලක් ගෙවිය යුතු බවට 2023 වර්ෂයේදී දැනුම් දී තිබූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 08 හි 22 වගන්තිය අනුව ඒ සදහා ප්‍රතිපාදනයක් හදුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ දී මේ සම්බන්ධව ගිණුම් තුලින් ප්‍රතිපාදනයක් හදුනාගෙන නොතිබුණි. 2024 අධිකාරියේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ඇස්තමේන්තු සංශෝධනය කර ගෙවීම් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අධිකාරිය වෙත මත්ස්‍ය තැන්පත් කිරීම් වැඩසටහන් සදහා ලද රු.85,827,680 ක අමාත්‍යාංශ ප්‍රදාන සහ රු.14,264,998 ක විදේශ ප්‍රදාන වශයෙන් ලද මුළු ප්‍රදාන එකතුව රු.100,092,678 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 හි 95 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආදායමට හඳුනා ගැනීමකින් තොරව ව්‍යාපෘති ගිණුම් වලට බැර කර තිබුණි. එම වැඩසටහන් සඳහා | විගණනයෙන් පෙන්වා දුන් මෙම ප්‍රමිතිය සම්බන්ධව තවදුරටත් අධ්‍යයනය කරමින් පවතින අතර ඉදිරියේ දී ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරිම හෝ නිවැරදි කිරීමක් සිදු කළ යුතුනම් එය සිදු කිරිමට කටයුතු කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.108,205,259 ක මුළු වියදමද ආදායම් ප්‍රකාශය තුලට නොගෙන ව්‍යාපෘති ගිණුම්වලට හර කර තිබුණි. | | |
| (ඉ) | අක්කරයක් පමණ වූ මන්නාරම ඔලෙයිතුඩාව මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරයේ ඉඩම රු.800,000 ක වටිනාකමකට 2016 වර්ෂයේ සිට අවු.30 කට බදු පදනම මත ලබාගෙන තිබූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි ඡේද 27 හි විධිවිධාන අනුව කල්බදු වටිනාකම වත්කම් හා වගකීම් යටතේ හඳුනාගත යුතු වුවද උක්ත බදු දේපළ කල්බදු දේපළක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි. | එකඟ වේ. 2024 වර්ෂයේ ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් රු .මිලියන 143 ක් වැයකර මඩකලපුව දිස්ත්‍රික්කයේ බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකර 2017 ජූනි 29 වන දින අධිකාරියට භාරදී තිබුණි . 2022 සැප්තැම්බර් 08 වන දින එම වත්කම රු.155,450,000 කට තක්සේරු කර තිබුණද එය මෙතෙක් අධිකාරියට පවරාගෙන එම වටිනාකම ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් ජංගම නොවන වත්කම් හා රජයේ ප්‍රදාන අඩුවෙන් දැක්වුණි. | මඩකළපුව බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරයේ තක්සේරු වටිනාකම ගිණුම් තුලින් හඳුනාගෙන නොමැත්තේ එම ඉඩම මෙතෙක් අධිකාරියට පවරාගෙන නොමැති බැවින් වේ. | අධිකාරිය විසින් භාවිතා කරන වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුදුකුඩිරිප්පුහි පිහිටි රු.75,880,829 ක්වූ ඉස්සන් අභිජනනාගාරය, ජලජීවි වගා සංවර්ධන හා තත්ත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය විසින් 2009 දෙසැම්බර් 30 දින අධිකාරියට භාරදී තිබුණද එදින සිට වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. 2015 ජූනි 22 දිනැති තක්සේරු වාර්තාවට අනුව මෙම අභිජනනාගාර ඉඩම හා ගොඩනැගිල්ල රු.47,951,600 කටද, අනෙකුත් වත්කම් රු.3,146,550 කටද තක්සේරු කර තිබූ අතර එම අයිතම කිසිවක් ගිණුම් ගතකර නොතිබුණි. භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලින්ද මෙම භාණ්ඩවල පැවැත්ම තහවුරු කර නොතිබුණි. මෙම වත්කම් 2016 වර්ෂයේ සිට රාජ්‍ය පෞද්ගලික හවුල් ගිවිසුම් යටතේ බදු දී තිබූ අතර මෙම වත්කම් 2016 වර්ෂයේ සිට 2023 | පුදුකුඩිරිප්පු පිහිටි ඉස්සන් අභිජනනාගාරය ඉදිකිරීම් පිරිවැය හෝ තක්සේරු වටිනාකම ගිණුම් තුලින් හඳුනා ගෙන නොමැත්තේ එම ඉඩම මෙතෙක් අධිකාරියට පවරා ගෙන නොමැති බැවින් වේ. | අධිකාරිය විසින් භාවිතා කරන වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින දක්වාම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගතකර නොමැති බැවින් 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් අඩුවෙන් දැක්වුණි. | | |
| (ඈ) | 2017 වර්ෂයේ සිට 2020 දක්වා අමාත්‍යාංශ ප්‍රදාන වලින් ඉදිකර තිබුණු හම්බන්තොට රැකව ක්‍රැබ්සිටි අභිජනනාගාරය සඳහා වූ රු.221,719,566 ක වියදම ජංගම නොවන වත්කම් හා විලම්භිත ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර 2022 වර්ෂයේදී එම වටිනාකම විලම්භිත ආදායම් ගිණුමෙන් ඉවත් කර කල්බදු අවිනිශ්චිත ආදායම් ගිණුමක් ලෙස ජංගම නොවන බැරකම් යටතේ ඇතුලත් කර තිබුණද ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙය නිරාකරනය කිරිමට තවදුරටත් අධ්‍යනය කරමින් පවතින අතර සුදුසු ක්‍රමවේදයක් හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | ආයෝජන දේපළ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | අධිකාරියට අයත් මුරුතුවෙල මධ්‍යස්ථානය මඟින් ඉදිරිපත් කරන ලද දැල් වර්ග (Netting) තොග ශේෂය සහ ගිණුම් ප්‍රකාශ තුළ දක්වා ඇති ශේෂ අතර රු. 1,334,964 ක වෙනසක් නිරූපණය වූ අතර ඒ පිළිබඳ සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුරුතවෙල මධ්‍යස්ථානයේ Netting Material වටිනාකම අතපසු වීමකින් ගිණුම් ගත වී ඇති අතර 2024 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | තොග ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඉ) | රැකව ජලජීවී වගා ව්‍යාපෘතිය වසර 30ක කාල සීමාවක් සඳහා පුද්ගලික සමාගමක් වෙත 2021 දෙසැම්බර් 02දින සිට බදුදී තිබූ අතර වසර 02 ක සහන කාලයෙන් පසුව 2023දෙසැම්බර් 02 දින සිට එම සමාගමෙන් අය විය යුතු සමාලෝචිත වර්ෂයට අදාළ බදුකුලී ආදායම් රු 7,440,760.ක් ලැබිය යුතු බදුකුලී ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ දී ලබා දුන් වාර්තාවේ රැකව වාර්ෂිකව රාජ්‍ය පෞද්ගලික ව්‍යවසාය යටතේ අයවිය යුතු අගය ඇතුලත්ව නොමැත. ඒ අනුව එම අගය ගිණුම්ගත වී නොමැත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් ලෙස රු.2,468,360 ක් දක්වා තිබුණද සත්‍ය මිලදී ගැනීම් වටිනාකම රු.15,299,714 ක්වූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම් රු.12,831,354 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අතපසු වීමකින් රු.4,978,453.50 වටිනාකමක් ගෙවීම් යටතට ඇතුලත්ව ඇත. 2024 වර්ෂයේ දී මේ සම්බන්ධව අවදානය යොමු කරනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන වටිනාකම් නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (උ) | තක්සේරු කරන ලද එකතු වටිනාකම රු.63,150,000 ක්වූ අක්කර 10.5 වූ ඉඩම් 2 ක් සහ හෙක්ටයාර් 3.976 ක්වූ ඉඩම් 3 ක්ද ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ කුසල බංගදෙණිය මධ්‍යස්ථානය සඳහා යාබද ඉඩමක් මිලදී ගන්නා ලද අතර එම අගය උපලේඛණයට ඇතුලත් වී නොමැත. 2024 වර්ෂය දක්වා ලබා දෙනු ලබන | අධිකාරියට අයත් ඉඩම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සියලුම තක්සේරු වටිනාකම් ගිණුම් තුල ගැලපීම් කිරිමට කටයුතු සිදු කරමින් පවතී. | |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ රු4,336,210. කට මිලදීගෙන තිබුණු ෆයිබර් ටැංකි 04ක් වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වේ. 2024 වාර්ෂික ගිණුම් තුලින් නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | අධිකාරියේ වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | 2019 ,2017සහ 2021වර්ෂවල සිට පැවත එන එකතුව රු 5,958,802 .ක්වූ ව්‍යාපෘති සහ වෙනත් ගෙවිය යුතු ශේෂ ආදායමක් ලෙස ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබු අතර නිශ්චිත පුද්ගලයන් සහ එම ශේෂ සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම ශේෂයන්ගෙන් අමාත්‍යාංශය හරහා දිවිනැගුම මත්ස්‍ය තැන්පත් කිරිම සඳහා ලබා දුන් හා ඉතිරි ප්‍රතිපාදන නැවත අමාත්‍යාංශය සඳහා ද පළාත් සභා මඟින් ලබා දී හඳුනාගත නොහැකි ඉතිරි ප්‍රතිපාදන ද අමාත්‍යාංශයට යොමු කර රජයේ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති ශේෂ සනාථ කිරීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | දිවි නැගුම ගිවිසුම නමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු 71,928,492.ක බැර ශේෂයක්ද දක්වා තිබුණු අතර එම ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාළ ශේෂ ලැයිස්තුවක් හා එම ශේෂයෙහි කාල විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් නොවූ බැවින් පැවැත්ම හා වටිනාකම පිළිබඳ සෑහීමට පත්වීමට නොහැකිවිය. | දිවිනැගුම ප්‍රතිලාභින් සම්බන්ධ ලේඛණයක් සැලසුම් හා අධික්ෂණ ඒකකයේ පවත්වාගෙන යනු ලබන අතර උසාවියෙන් යොමු කල චෙක්පත් වටිනාකම තුල දිවිනැගුම හිඟ වාරික ප්‍රමාණය හඳුනාගත නොහැකි වීම මත මෙම ලේඛණය යාවත්කාලින කිරිම ගැටලු සහගත තත්වයක් උද්ගතව ඇත. ඒ අනුව නිවැරදිව අයකර ගැනීමට ඇති හිඟ මුදල් සම්බන්ධ ලේඛනයක් ඉදිරිපත් කිරීම ගැටලු සහගතව ඇත. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති ශේෂ සනාථ කිරීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඔ) | අධිකාරියේ කාර්තුමය විකුණුම් ආදායම මත හඳුනාගත යුතු රු.6,697,682 ක්වූ සමාජ ආරක්ෂණ දායකත්ව බදු වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ,ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දැක්වුණි. | අධිකාරිය ඉහත සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා ලිපියක් පොදු ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව, මුදල් | වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ලබා දෙනු ලබන උපදෙස් මත කටයුතු සිදු කිරීමට නියමිතය. | |
| (ඕ) | විදේශ ප්‍රදාන ලෙස තාක්ෂණික සහය වැඩසටහන වෙතින් 2023 සැප්තැම්බර් 08 දින ලැබුණු රු.1,151,975 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත්වී නොමැති බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ විදේශ ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. තවද සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කළ රු.1,184,975 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් නොවීම නිසා මුදල් වැය කිරීම්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | එකඟ වෙමි. අතපසු වීමකින් ශීර්ෂ මාරු වී සටහන් වී ඇත. | අධිකාරිය වෙත සංවර්ධන වැඩසටහන් සඳහා ලැබෙන විදේශ ප්‍රදාන නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කළ යුතුය. |
| (ක) | කුසලබංගදෙනිය කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය බදුදීමට අදාලව රු.653,150 ක බදු මුදලක් ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම ප්‍රමාණය ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | ගිවිසුමේ 19 වන වගන්තිය අනුව ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු ඇරඹීම සඳහා මාස 02 ක සහන කාලයක් ලබා දෙන ලදී. එම නිසා බදු මුදල් අය කිරීම ආරම්භ කරන ලද්දේ 2023 වර්ෂයේ ජූනි මස 01 වන දින සිට බව කාරුණිකව දැනුම් දෙමි. | ලැබිය යුතු ආදායම් හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ග) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රැබ්සිටි ව්‍යාපෘතිය බදුදීම සඳහා ගිවිසුම් ගතවීමේදී අධිකාරිය විසින් අභිජනනාගාර භූමියේ ඇති 2019 වර්ෂයේදී මිලදී ගත් රු.මිලියන 7.9ක් වටිනා ස්ථාවර වත්කම් අදාළ වත්කම්වලට ප්‍රාග්ධනිත නොකර ව්‍යාපෘති ඉදිකිරීම් පිරිවැය යටතේ ගිණුම් තබා තිබුණි. | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රැබ් සිටි ව්‍යාපෘතිය බදු දීම සඳහා ගිවිසුම්ගත වීමේදී ගිවිසුමට ඇතුලත් වන දිනය වන 2021 දෙසැම්බර් 02 දින ඉන්වෙන්ට්‍රි, අයිතම හඳුනාගෙන නොතිබූ නිසා ගිවිසුමට ඇතුලත් නොකළ ද 2022/02/03 දින වන විට ඉන්වෙන්ට්‍රි, අයිතම හඳුනාගෙන ලැයිස්තු ගත කර තැප්‍රොබේන් ෆ්‍රෝසන් සීෆුඩ් (පුද්) සමාගම වෙත භාර දීම සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනයට ඉදිකිරීම් වත්කම් අගය හඳුනාගනු ලබන්නේ මූල්‍ය අංශයෙන් ගෙවූ වවුචර මතය. ඒ අනුව එහි ඇතුලත් අයිතම් | ස්ථාවර වත්කම් අදාළ වත්කම්වලට ප්‍රාග්ධනිත කළ යුතුය. |

වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි වුව ද අගය තිරණය කළ නොහැකි වේ. ඒ අනුව ඉදිරියේ දී ඉදිකිරීම් පිරිවැය ගිණුම්ගත කරනු ලබන්නේ අදාල අංශයෙන් ලබා දෙන අගයන් මත පමණි.

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ශේෂ තහවුරු ලිපි ඉදිරිපත් කළ ආයතන 05 ක් විසින් එකතුව රු.3,850,435 ක් වටිනා ණයගැති ශේෂයන් සමඟ එකඟවී නොතිබු බැවින් එම ණයගැති ශේෂවල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | 3,850,435 | - | 3,850,435 | මෙම ශේෂ සනාථ ලිපි වලට එකඟ නොවන ශේෂයන් සම්බන්ධව අධ්‍යනනය කර ව්‍යාප්ති අංශය හා එක්ව නිරවුල් කිරිමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති ශේෂ සනාථ කිරීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණයක් නොකර, මධ්‍යස්ථාන භාරව සිටින ස්ථානභාර නිලධාරින්ගේ වාර්තා අනුව තොග වටිනාකම රු.87,172,848ක් ලෙස ගිණුම් ගතකර තිබූ බැවින් මෙම වටිනාකමෙහි නිවැරදිතාවය හා පැවැත්ම තහවුරු නොවීය . | 87,172,848 | තොග සමීක්ෂණ වාර්තා | සත්‍ය වශයෙන් ම මෙම තොග පැවැත්ම සනාථ කිරිම සඳහා කමිටුවක් තොග සමීක්ෂණ කටයුතු පිළිබඳව අධ්‍යානය කරමින් පවති. | තොග සමීක්ෂණයක් සිදුකර එම වාර්තා පදනම් කරගෙන තොග වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2022 සැප්තැම්බර් 20 දිනැති, 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ II කොටසේ 4(I)(ආ) | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම සඳහා සුදුසුකම් ලබන ආයතනයක යම් කාර්තුවක් සඳහා එසේම පිරිවැටුම රු. මිලියන 30 ක් ඉක්මවන්නේ නම්, සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත යටතේ ලියාපදිංචි වියයුතු අතර, බදු පනතේ V වන කොටසේ 16 ප්‍රතිපාදන ප්‍රකාරව උපචිත පදනමක් මත බදු ගිණුම් තැබීම සහ පනතේ 17(1) හි ප්‍රතිපාදන ප්‍රකාරව බදු ගෙවීම සිදුකළ යුතු වූවද අධිකාරියේ 2023 වර්ෂයේ මත්ස්‍ය විකුණුම් ආදායම සම්බන්ධව පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අධිකාරිය ඉහත සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා ලිපියක් පොදු ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව, මුදල් අමාත්‍යංශයේ ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ලබා දෙනු ලබන උපදෙස් මත කටයුතු සිදු කිරිමට නියමිතය. | සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසිය 396 (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ 0003270048 දරන බැංකු ගිණුමේ එකතුව රු.2,625,470 ක්වූ ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ චෙක්පත් 57 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම ගැටලුව විගණන හා කළමණාකරන රුස්වීමට ඉදිරිපත් කර නිරාකරනය කිරීමෙන් පසු ලබා දෙන උපදෙස් මත කටයුතු කිරිමට නියමිතය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii)මු.රෙ. 570, 571 ප්‍රකාරව | වර්ෂ 2ක් ඉක්මවූ එකතුව රු.32,191,028 ක තැන්පතු නියාදනය කිරීමට කටයුතු කළ යුතු වුවද එසේ රාජ්‍ය ආදායමට බැර කිරීමකින් තොරව රඳවාගැනීම් ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2015 වර්ෂය දක්වා ඉල්ලීම් නොකළ කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් මෙවන විට ගිණුමෙන් ඉවත් කිරිම සඳහා අනුමත කරගෙන ඇත. තවද 2016 පසු වර්ෂයන්ට අදාලව ද මු. රෙ. අනුව වසර දෙකට වැඩි කොන්ත්‍රාත් මත රඳවා ගැනීම ද 2024 වර්ෂයේ දී | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉවත් කිරිමට කටයුතු කිරිමට නියමිතය. | |
| (ඇ) 2022 ජුලි 08 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 (4.4) | රාජ්‍ය සංස්ථා විසින් ප්‍රයෝජනයට ගනු ලබන විදේශාධාර සම්බන්ධව වැය ඇස්තමේන්තුවට ප්‍රතිපාදන සලසා රේඛීය අමාත්‍යාංශය හරහා ආයතනය වෙත විදේශ ප්‍රදාන ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අධිකාරිය වෙත ලැබී ඇති රු.මි.14.26 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් එම විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ILO ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවයෙන් ලබාදී ඇත. | අධිකාරිය වෙත විදේශ ප්‍රදාන ලබාගැනීමේදී චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත විය යුතුය. |
| (ඈ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2011 ආප්‍රේල් 21 දිනැති අංක MOEF/ERD/2011/01දරන චක්‍රලේඛය හා 2014 ජූනි 26 දිනැති අංක MOEF/ERD/2014/01 දරන චක්‍රලේඛය | විදේශ ප්‍රදාන ලබාදීම සහ ගිවිසුම්වලට එළඹීම සම්බන්ධ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සිදුවිය යුතු වුවද අධිකාරිය වෙත ලැබී ඇති රු.මි.14.26 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධව ඒ අයුරින් කටයුතු කර නොතිබුණි. | ILO ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා දී ඇත. ඔස්ට්‍රේලියානු රජය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබුණු ACIRA ව්‍යාපෘතිය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් අනුමත ව්‍යාපෘතියක් වේ. මෙම ව්‍යාපෘතිය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් අනුමත ව්‍යාපෘතියක් බැවින් මේ සඳහා අප අධිකාරිය වෙත ලැබිය යුතු ප්‍රතිපාදන සෘජුවම ඔස්ට්‍රේලියානු රජය මගින් අප අධිකාරිය වෙත නිකුත් කර ඇත.මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ මුල් කාර්තුවේදී අවසන් වීමට නියමිතය. | අධිකාරිය වෙත විදේශ ප්‍රදාන ලබාගැනීම සහ ගිවිසුම්වලට එළඹීමේදී චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ)2019 මාර්තු 26 දිනැති 02/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසායකත්ව ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයන් තෝරා ගැනීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුවක් මගින් | ව්‍යාපෘති සඳහා අභිලාෂ කැඳවීමේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් ප්‍රසම්පාදන තීරණ ගනු ලැබූ අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික නිර්දේශයන් ගැනීම සඳහා ද තාක්ෂණික | රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසායකත්ව ආයෝජන ක්‍රියාවලියේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රාජ්‍ය පෞද්ගලික ආයෝජන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකළ යුතු වුවද රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසායකත්වය ව්‍යාපෘති ලෙස බදු දී ඇති කුසලබංගදෙනිය අභිජනනාගාරය සඳහා එම ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. | කමිටුවක් පත් කර ඇත. | |
| (ඊ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 13.2 වගන්තිය | චක්‍රලේඛයේ විධිවිධාන අනුව රාජ්‍ය ආයතනයක් විසින් අබලන් වූ පාවිච්චි කල නොහැකි වාහන හඳුනාගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර සමීක්ෂණයක් කළ යුතු වුවද අධිකාරියේ වාහන සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අධිකාරියේ පවතින අබලන් වූ පාවිච්චි කල නොහැකි වාහන හඳුනාගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර අබලන් වාහන හඳුනාගැනීම සිදුකරගෙන යනු ලැබේ. | අබලන් වූ පාවිච්චි කල නොහැකි වාහන සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.119,724,959 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.103,989,075 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.223,714,034 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රු. 53,982,047 ක ආදායමේ අඩුවීම, රු. 97,895,250 ක විකුණුම් පිරිවැය වැඩිවීම, රු14,114,804 ක පරිපාලන වියදම් වැඩිවීම, රු. 26,171,080 ක බෙදාහැරීම් වියදම් වැඩිවීම සහ රු. 251,152 ක මූල්‍ය වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුරුතවෙල වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අත්තිකාරම් හා ගෙවීම් බිල්පත් ලෙස ගෙවූ රු.4,412,475 ක මුදල අයකර ගැනීමට නොහැකිවී තිබූ අතර ගෙවූ මුදලද නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. මීට අමතරව මුරුතවෙල 01 කොන්ත්‍රාත්තුව මඟින් ගෙවූ රු.8,262,017 ක මුදලට අදාල | 2021/R/MURL/02 අදාල ප්‍රතිසංස්කරණ කටයුතු උක්ත කොන්ත්‍රාත්තුව ඇවර කිරීමෙන් පසු මේවන විට අවසන් කර ඇති අතර අදාල කාර්යසාධන ඇපකරය වන රු.610,473 ක මුදල අධිකාරිය වෙත ලබාගෙන ඇත. 2021/R/MURL/02 අදාල කොන්ත්‍රාත්තුව ඇවර කිරීමෙන් පසු සම්පූර්ණ කර නොතිබු | ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ පරිදි කඩිනමින් නිම කළ යුතු අතර අත්තිකාරම් ලෙස ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම් ද මේ වන තෙක් නිම වී නොතිබුණි. | පොකුණු සම්පූර්ණ කර නිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. එසේම මෙම කොන්ත්‍රාත්කරු වෙතින් අයකර ගතයුතු රු.9,546,600 ක අත්තිකාරම් මුදලද රු.7,150,950 කට ආසන්න කාර්යසාධන ඇපකරයට අදාල මුදලද අධිකාරිය වෙත ලබා ගෙන ඇති අතර මෙය වානිජ මහාධිකරණයේ තීන්දුව අනුව සිදු කර ඇත. | |
| (ආ) | ජංගම නොවන වගකීම් යටතේ වූ රු.54,040,042 ක ශේෂයක් වසර ගණනාවක සිට පැවතියද එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු. 54,040,042 ක් වටිනා මෙම ශේෂය වසර 10 පෙර සිට පැවත එන අතර මෙම ශේෂය ඇති වූ ආකාරය හා ඒ සම්බන්ධ ප්‍රමාණවත් තොරතුරු නොමැති කම නිසා එම ශේෂය නිරවුල්නොවී තවදුරටත් පවති. | නිරවුල් නොවී පවතින ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් 88 දෙනෙකුගෙන් රු.45,682,378 ක ලැබිය යුතු ශේෂයක් වූ අතර ඒ තුළ වසර 1-3 ත් අතර රු.39,552,087 ක්ද වසර 3ත් 5ත් අතර රු.1,495,451 ක්ද, වසර 5 ඉක්මවූ රු.4,034,840 ක ශේෂයක්ද පැවති අතර එම ශේෂයන් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ජලජීවී අධිකාරිය මගින් රුපියල් මිලියන 238.46 ක වටිනාකමකට අදාලව මත්ස්‍ය බීජ ණය ලබාදී එම ණය අයකරගැනීම සඳහා ණය කමිටුවක් පත්කර විධිමත් ලෙස කටයුතු කර රු.මි 4.39ක් හැර ඉතිරි මුදල් අයකරගෙන හා අයකරගැනීමට කටයුතු කරමින් පවති. එම මුදල සමස්ථ ණය නිකුත් කිරීමේ මුදල වන රු.මිලියන 238.46 ක මුදලින් 1.84% ක ප්‍රතිශතයකි. | ණයගැතියන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ බාහිර පාර්ශවයන්ට ලබාදෙන ලද රු.3,322,500 ක ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට සක්‍රීයව දායක නොවූ ප්‍රතිලාභීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් ඔවුන් වෙත එන්තර වාසි යොමුකරමින් හා සමහර ප්‍රතිලාභීන් වෙත නඩු පවරා නැවත මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී. | දිවිනැගුම ප්‍රතිලාභින්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගත යුතුය. |
| (ඉ) | අවලංගු කරන ලද කොන්ත්‍රාත් දෙකක් සම්බන්ධයෙන් අධිකාරියට | St Theresa Industries (pvt) ltd ආයතනයෙන් අයවීමට ඇති | අධිකාරියට අයවියයුතු මුදල් |

| | | |
|---|---|---|
| අයවිය යුතු රු.11,213,291 ක මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.1,540,507 මුදල සම්බන්ධව නීතිපති උපදෙස් පතා ලිපියක් යොමු කර ඇත. ලබා දෙනු ලබන උපදෙස් මත කටයුතු සිදු කිරීමට නියමිතය. Kirula Eng. Service (pvt) ltd ආයතනයෙන් අයවීමට ඇති රු.9,672,784 වටිනාකම සංශෝධනය වී ඇති අතර එම සංශෝධිත අගය අය කරගෙන ඇත. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපදේශන සේවා ආයතනයක් වෙත 2016 හා 2017 වර්ෂවලදී ගෙවන ලද රු.4,683,789 ක්වූ මුදලට අදාළව උපදේශන සේවා සම්පූර්ණ කර නොතිබියදී නැවත වරක් 2022 වර්ෂයේ මඩකලපු දිස්ත්‍රික්කයේ ජලජීවි උයනක් ඉදි කිරීම සඳහා සැලසුම් කිරීමේ හා ඉදිකිරිමේ උපදේශන සේවා කටයුතු එම ආයතනයටම රු.4,219,408 ක මුදලකට පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම කොන්ත්‍රාත්තුවට අදාළව රු.1,538,750 ක් ප්‍රාග්ධනිත කර තිබුණද අදාළ වැඩ සම්පූර්ණ කර නොතිබූ බැවින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබූ අතර එම ගෙවීම්ද නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | අදාල ආයෝජනකරුවන් සහ උපදේශන සමාගම සම්බන්ධ කොට ඉදිරි වැඩකටයුතු කරගෙන යෑමට අධිකාරිය බලාපොරොත්තු වේ. | අදාළ ඉදි කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමට 2019 ඔක්තෝබර් 08 දින රු.11,802,000 ක් වටිනා උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබූ මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රය මඟින් වාර්ෂිකව තිලාපියා මත්ස්‍ය ආහාර කිලෝග්‍රෑම් 127,000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කළද, 2021, 2022 හා 2023 වර්ෂයේ පිළිවෙලින් කිලෝ ග්‍රෑම් | ජලජීවී අධිකාරියේ වර්තමාන සභාපතිතුමා විසින් මෙම යන්ත්‍රය රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාම නවතා නැවත නිෂ්පාදන කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත. එම උපදෙස් වලට අනුව කටයුතු සිදුකරමින් පවතී. | තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | 36,612 ක් ද, කිලෝ ග්‍රෑම් 38,361 ක් හා කිලෝ ග්‍රෑම් 4.23 ක් ද නිෂ්පාදනය කර තිබුණි. 2024 වර්ෂයේ ඔක්තෝබර් 20 දින වන විට නිෂ්පාදනයක් සිදුකර නොතිබුණු අතර මේ වනවිට මෙම යන්ත්‍රය ඌණ උපයෝජිතව පැවතුණි. | | |
| (ආ) | අධිකාරිය විසින් ජලජීවී වගා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් අක්කර 14 ක් හා හෙක්ටයාර් 138.275 ක්වූ ඉඩම් 06 ක් ලබාගෙන තිබුණද, එම ඉඩම් ජලජීවී වගා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් උපයෝගී කර ගැනීමකින් තොරව නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධනය සඳහා ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරිමට යෝජිත වූ මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරය, මුහුදු පැළැටි පටක රෝපණ මධ්‍යස්ථානය, කකුළුවන් අභිජනනාගාරය හා වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය ව්‍යාපෘති ප්‍රතිපාදන වෙන් නොවීම මත ආරම්භ කිරිමට නොහැකි වී ඇත.<br>මන්නාරම දිස්ත්‍රික්කයේ සවුත්බාර් පිහිටි ඉඩම පමණක් භාර දී ඇති අතර අනෙකුත් ඉඩම් සුදුසු ලෙසට හඳුනාගෙන ඉල්ලීම් කර ඇතිමුත් අප වෙත භාරදීමක් සිදු වී නැත. | අධිකාරියේ ප්‍රයෝජනය සඳහා ලබාගත් ඉඩම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2022 වර්ෂයේ මධ්‍යස්ථාන 6 ක පිහිටි වර්ග මීටර 45350 ක මත්ස්‍ය ටැංකි නිශ්කාර්යව පැවති අතර 2023 වර්ෂය වන විට මධ්‍යස්ථාන 04 ක පිහිටි වර්ගමීටර 35808 ක ටැංකි ප්‍රමාණයක් නිශ්කාර්යව පැවතුණි. උඩවලව කාප් මධ්‍යස්ථානයේ වර්ගමීටර් 64900 ක් ටැංකි ධාරිතාවයෙන් වර්ගමීටර් 21300 ක් 2021 වර්ෂයේ සිට නිශ්කාර්යව පවතින නමුත් ක්‍රියාකාරි මට්ටමට පත්කර ගැනීමට අපොහොසත් වී තිබුණි. උඩවලව මධ්‍යස්ථානයේ 2022 වර්ෂයේ වර්ගමීටර් 2150 ක් නිශ්කාර්යව පැවති අතර 2023 වනවිට එම ප්‍රමාණය වර්ගමීටර් 11800 ක් දක්වා වර්ධනය වී තිබුණි. | මිරිදිය ජලජීවී මධ්‍යස්ථාන වන දඹුල්ල මධ්‍යස්ථානයේ ව.මී.7,000 පොකුණු ප්‍රමාණයේ බැම් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කර ඇත. ව.මී. 4,800 පොකුණු ප්‍රමාණය FAO ව්‍යාපෘතිය මඟින් ප්‍රතිසංස්කරණය කරමින් පවතී. ඉඟිණියාගල පොකුණු ව.මී.4,500 තාවකාලිකව නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදවා ඇත. තවද ඉරණමඩු නිෂ්කාර්ය ව.මී. 2,708 ක පොකුණු ප්‍රමාණය අළුත්වැඩියා කිරීමට ඇත. උඩවලව නිෂ්කාර්ය පොකුණු අළුත්වැඩියා කිරිම සඳහා මුදල් වෙන් වි නොමැත. | මත්ස්‍ය ටැංකිවල ධාරිතාවය ක්‍රියාකාරි නිෂ්පාදන මට්ටමට පත්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |